නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය
வீடமைப்பு மற்றும் சமுர்த்தி அமைச்சு
Ministry of Housing and Samurdhi

4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4 tJ khb nrjrugha gjjuKyy
4th floor, Sethsiripaya ,Battaramulla


# දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
# வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
# Department of Divineguma Development

මගේ අංකය / எனது இல / My No: DDD/HO/7/SD/16/ENV

ඔබේ අංකය / உமது இல / Your No: ........................................

දිනය / திகதி / Date: 2017.02. 13

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියළුම දිවිනැගුම දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන්,

**<u>සමෘද්ධි හරිත උයන වැඩසටහන 2017</u>**

ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබ වෙත යොමු කළ මාගේ සමාංක හා 2017.01.04 දිනැති ලිපිය හා බැදේ.

02. එකී ලිපිය අනුව 2017.02.09 දින සුභ මොහොතින් ආරම්භ කිරීමට යෝජිතව පැවැති ඉහත වැඩසටහන වියළි කාලගුණික තත්ත්වය ප්‍රකාශයට පත් කිරීම නිසා කල් දැමීමට සිදුවිය. නමුත් එම වැඩසටහන දැනටමත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඔබ විසින් හඳුනාගෙන ඇති ස්ථාන වල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට එක් වැඩසටහන් ලෙස ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත. දැනටමත් ඔබවෙත දැනුම් දී ඇති පරිදි එම වැඩසටහන් 2017 අප්‍රියෙල්, මැයි නිරිත දිග මෝසම් වැසි ඉලක්ක කර හා සැප්තැම්බර් මුල් සතියේ ඊසාන දිග මෝසම් වැසි ඉලක්ක කර ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

03. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට 2017 වර්ෂයේ දෙපාර්තමේන්තු ප්‍රතිපාදන වලින් රුපියල් 60000.00 ප්‍රතිපාදන ලබාදීමට අපේක්ෂා කරන එම ප්‍රතිපාදන වලින් 75% සෘජුවම පැල,පොහොර මිල දී ගැනීම වැනි අයිතම සඳහා යෙදවීම අත්‍යවශ්‍යය. ඒ අනුව ඔබ දිස්ත්‍රික්කය සඳහා වෙන්වන මුදල රු:60000/-× = කි. එමෙන්ම කිසියම් හේතුවක් නිසා යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක හරිත උයන් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වන්නේ නම් එම ප්‍රතිපාදන වෙනත් ස්ථානයක ක්‍රියාත්මක කරන හරිත උයනක් සඳහා යොදවාගෙන ඉතා සාර්ථක හරිත උයන් ප්‍රමාණයක් ස්ථාපිත කිරීමට අවකාශ සලසා ගත හැකිය.

04. ඔබ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් හඳුනාගෙන ඇති ස්ථාන පදනම් කරගෙන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තොරතුරු මේ සමඟ අමුණා ඇති ආකෘතිය අනුව සම්පූර්ණ කර ඉතා කඩිනමින් මා වෙත ලබාදෙන මෙන් කාරුණිකව දන්වන අතර ඉන් අනතුරුව ප්‍රතිපාදන නිදහස් කිරීමට කටයුතු කෙරේ. මෙම තොරතුරු පදනම් කරගෙන සෑම වැඩසටහනක් සඳහාම ව්‍යාපෘති වාර්තාවක් ( නඩත්තු කිරීමේ වැඩ පිළිවලක් ඇතුලත්ව ) සකස් කිරීමට ඔබගේ අවධානය යොමු කරනු මැනවි.

05. තවද මෙම වැඩසටහන පිළිබඳව දැනටමත් ජාතික මට්ටමින් දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානින් දැනුවත් කර ඇති බැවින්, ප්‍රාදේශීය මට්ටමින් එම ආයතන වල නිළධාරින් සමඟ මනා


| | | | | |
|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | අධ්‍යක්ෂ (පාලන) | ප්‍රධාන ගණකාධිකාරී | කාර්යාලය |
| பணிப்பாளர் தலைமையதிபதி | மேலதிக பணிப்பாளர்தலைமையதிபதி | பணிப்பாளர் (நிர்வாகம்) | பிரதான கணக்காளர் | அலுவலகம் |
| Director General | Additional Director General | Director (Administration) | Chief Accountant | Office |
| Tel- 011-2873802 | 011-2871672 | 011-2873799 | 011-2869742 | 011-2887280 |
| Fax -011-2889002 | 011-2871672 | 011-2873996 | 011-2869742 | **011- 2887722(Hotline)** |
| dg@divineguma.gov.lk | adg@divineguma.gov.lk | diradmin@divineguma.gov.lk | finance@divineguma.gov.lk | |

සම්බන්ධීකරණයකින් වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික හා ද්‍රව්‍යමය සහාය ලබා ගැනිමට කටයුතු කළ යුතුය.

06. මෙම වැඩසටහන තවත් එක් රුක්රෝපණ වැඩසටහනක් නොවී ඵලදායි හා තිරසර වැඩසටහනක් බවට පත් කර ගැනිම සඳහා දිර්ඝ කාලීන නඩත්තු වැඩපිළිවලක් සකස් කිරීමට ඉහල ප්‍රමුඛත්වයක් දි කටයුතු කරන මෙන් ඉල්ලා සිටින අතර මෙම වැඩසටහන් නියමිත කාලය තුළ දි ආරම්භ කරන ලෙසත් ඒ සඳහා අවශ්‍ය මුලික කටයුතු සංවිධානය කරන ලෙසත් කාරුණිකව දැනුම් දෙමි.

මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහාය ඉතා අගය කොට සලකමි.

නීල් බණ්ඩාර හපුහින්න

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත:- සියළුම අංශ ප්‍රධානින්, දැ.ගැ.ස හා අ.ක ස